# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.08.31 |

## කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 අගෝස්තු මාසයේ දී සියයට 64.3ක් වශයෙන් වාර්තා විය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 ජූලි මාසයේ පැවති සියයට 60.8හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 64.3ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මෙලෙස ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ මාසික ඉහළ යෑම් හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ජූලි මාසයේ පැවති සියයට 90.9හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 93.7 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ජූලි මාසයේ පැවති සියයට 46.5හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 50.2 දක්වා ඉහළ ගියේය.

| උද්ධමනය | ජූලි 2022 | අගෝස්තු 2022 |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 230.1 | 235.8 |
| මාසික වෙනස (%) | 4.5 | 2.5 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 60.8 | 64.3 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 23.1 | 28.0 |
| **මූලික** | | |
| දර්ශක අගය | 208.0 | 212.0 |
| මාසික වෙනස (%) | 3.9 | 1.9 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 44.3 | 46.6 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 16.7 | 20.3 |

**කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




2022 අගෝස්තු මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 2.45ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් පිළිවෙළින්, සියයට 0.83කින් සහ සියයට 1.62කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, නැවුම් මත්ස්‍ය, පලතුරු, පාන්, බිස්කට්, බිත්තර සහ කුකුල් මස් මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, සහල් සහ පරිප්පු මිල ගණන් වල පහළ යෑමක් මෙම මාසය තුළ දී වාර්තා විය. මේ අතර, ආහාර නොවන කාණ්ඩය තුළ 2022 අගෝස්තු මාසයේ දී, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන (විදුලි බිල සහ නඩත්තු කටයුතු/පිළිසකර කිරීම්), ප්‍රවාහන (පාසල් ප්‍රවාහන ගාස්තු සහ ගුවන් ගමන් ගාස්තු), රෙදිපිළි සහ පාවහන් සහ විවිධ භාණ්ඩ සහ සේවා යන උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ ගියේය.

**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 ජූලි මාසයේ පැවති සියයට 23.1හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 28.0 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 ජූලි මාසයේ පැවති සියයට 44.3හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 46.6 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 ජූලි මාසයේ පැවති සියයට 16.7හි සිට 2022 අගෝස්තු මාසයේ දී සියයට 20.3 දක්වා ඉහළ ගියේය.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

**උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2021 | අගෝස්තු | 143.5 | 144.6 | 0.3 | 0.3 | 6.0 | 4.1 | 4.3 | 3.2 |
| | සැප්තැම්බර් | 144.1 | 146.0 | 0.4 | 1.0 | 5.7 | 5.0 | 4.5 | 3.3 |
| | ඔක්තෝබර් | 146.9 | 147.9 | 1.9 | 1.3 | 7.6 | 6.3 | 4.8 | 3.6 |
| | නොවැම්බර් | 150.7 | 149.4 | 2.6 | 1.0 | 9.9 | 7.0 | 5.3 | 4.0 |
| | දෙසැම්බර් | 154.7 | 151.3 | 2.7 | 1.3 | 12.1 | 8.3 | 6.0 | 4.4 |
| 2022 | ජනවාරි | 158.4 | 154.1 | 2.4 | 1.9 | 14.2 | 9.9 | 6.9 | 5.0 |
| | පෙබරවාරි | 160.1 | 155.7 | 1.1 | 1.0 | 15.1 | 10.9 | 7.9 | 5.7 |
| | මාර්තු | 164.9 | 159.4 | 3.0 | 2.4 | 18.7 | 13.0 | 9.1 | 6.5 |
| | අප්‍රේල් | 180.2 | 172.4 | 9.3 | 8.2 | 29.8 | 22.0 | 11.3 | 8.1 |
| | මැයි | 195.2 | 182.9 | 8.3 | 6.1 | 39.1 | 28.4 | 14.2 | 10.2 |
| | ජූනි | 220.2 | 200.2 | 12.8 | 9.5 | 54.6 | 39.9 | 18.4 | 13.3 |
| | ජූලි | 230.1 | 208.0 | 4.5 | 3.9 | 60.8 | 44.3 | 23.1 | 16.7 |
| | අගෝස්තු | 235.8 | 212.0 | 2.5 | 1.9 | 64.3 | 46.6 | 28.0 | 20.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව